# නිදහසෙන් පසු සංවර්ධන කටයුතු

## 6.2 පිලිතුරු පත්‍රය

1)

- වියළි කලාපයේ ගොවිබිම් ඵලදායි ලෙස කෘෂිකාර්මික කටයුතු වලට යොදා ගැනීමට අවශ්‍ය නිත්‍ය ජල පහසුකම් සැපයීම .
- ඉහළ යන විදුලිබල ඉල්ලුම සඳහා විදුලි බලය නිෂ්පාදනය කිරීම.
- ජල සම්පාදනය නිසා නව ජනාවාස බිහි කිරීමෙන් ඉඩම් නැති ජනතාවට ඉඩම් සපයා දී ආහාර බෝග වගාව ව්‍යාප්ත කිරීම .
- රැකියා හා කෘෂිකර්මාන්ත අවස්ථා බිහි කිරීම .
- ගංවතුර පාලනය හා මිරිදිය මසුන් බෝකිරීම .

2) පොල්ගොල්ලේ දී මහවැලි ගඟ හරහා විශාල බැම්මක් තනවා උමගක් හරහා සුදු ගඟට ජලය ලබාගෙන බෝවතැන්න ජලාශය හරහා රජරට වියළි කලාපයට ජලය ගෙන යාම .

3)

- කලා වැව
- නාච්චදූව වැව
- නුවර වැව
- තිසා වැව

4) මහවැලි සංවර්ධන මණ්ඩලය වෙනුවට මහවැලි සංවර්ධන අමාත්‍යාංශයත් පිහිටුවීම හා මහවැලි අධිකාරිය පිහිටුවීම .

5)

- කොත්මලේ
- වික්ටෝරියා
- රන්දෙණිගල
- රන්ටැඹේ
- උල්හිටිය
- රත්කිඳ
- මාදුරුඔය

6) රත්කිඳ උමග

මාදුරු ඔය උමග

ජල හැරවුම් මධ්‍යස්ථානය - මිනිපේ

7) කොත්මලේ - ස්වීඩනය

වික්ටෝරියා - බ්‍රිතාන්‍ය

රන්දෙණිගල - බටහිර ජර්මනිය

8) 1958 රාජ්‍ය වැවිලි සංස්ථාව

1976 උඩරට වතු සංවර්ධන මණ්ඩලය

1976 ජනතා වතු සංවර්ධන මණ්ඩලය

9) මාතලේ

10) කුණ්ඩසාලේ, දැල්පිටිය ,නාරම්මල

11)

- රජයේ පාසල් පිහිටුවීම හා අධ්‍යාපන ව්‍යාප්තියට මුදල් යෙදවීම නිසා රට පුරා පාසල් සංඛ්‍යාව ඉහළ යාම .
- විෂය මාලා සංවර්ධනය හා ගුරු පුහුණු කටයුතු නවීකරණය වීම .
- විද්‍යාගාර පහසුකම් හා පාසල් පුස්තකාල පහසුකම් ව්‍යාප්ත වීම .
- දිවා ආහාරය පාසල් පොත් පොත් වෛද්‍ය හා දන්ත වෛද්‍ය සේවා සහ පාසල් නිල ඇඳුම් ආදිය නොමිලේ ලබා දීමත් සහනදායී ගමනාගමන පහසුකම් ලබාදීමත් එමගින් ශිෂ්‍ය සුබසාධන සේවා හා උපකාරක කටයුතු වැඩිදියුණු කිරීම .
- වෘත්තීය අධ්‍යාපන ආයතන පිහිටුවමින් එකී අධ්‍යාපන කටයුතු පුළුල් කිරීම

12)

- ග්‍රාමීය ප්‍රදේශවල රෝහල් පිහිටුවීම .
- වින්නඹු මාතෘ හා ළමා සෞඛ්‍ය සේවා දියුණු කිරීම .
- ප්‍රතිශක්තිකරණ එන්නත් ලබාදීම .
- වෛද්‍ය සායන පැවැත්වීම.
- දේශීය වෛද්‍ය ක්‍රමය දියුණු කිරීමට කටයුතු කිරීම .